# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1888/39 - 2014 නොවැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2014.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

15(1) වැනි වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමයෙන් මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති, ගාල්ල මහ නගර සභාවට අයත් ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 14 වැනි දින,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල මහ නගර සභා සීමාව තුළ, කළුවැල්ල ගමේ පිහිටියා වූ ද බලයලත් මිනින්දෝරු පී. එම්. සුනිල් මහතා විසින් මැන පිළියෙල කරන ලද අංක 2413 හා 2013.12.10 දිනැති සැලැස්මේ කැබලි අංක 2 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0907 (අක්. 00. රූඩ් 00. පර්. 35.8)ක් විශාල වූ කොළඹ පාරේ, වරිපනම් අංක 5/1 දරන තානායම් ඉඩමේ ඉතිරි කොටස :

**ඉඩමේ මායිම් පහත පරිදි වේ :**

| | | |
|---|---|---|
| උතුරට | : | උද්‍යානය ; |
| නැගෙනහිරට | : | පාර සහ මුහුද ; |
| දකුණට | : | මුහුද ; |
| බටහිරට | : | මෙම සැලැස්මේ කැබලි අංක 1. |

11 - 847